| නිවුඩු සහ පරළු (ටොන්) .. | — | — | — | — | 8,107 | 3,337·7 |
| 5. ලංකා ශතල් සහ මේද | | | | | | |
| මේද අම්ල (ටොන්) .. | 1,122 | 1,712·2 | 1,355 | 2,410·6 | 1,280 | 2,479·1 |
| ගලිසරින් (ටොන්) .. | 120 | 242·0 | 149 | 249·5 | 148 | 231·2 |
| 6. ලංකා ඛනිජ තෙල් | | | | | | |
| නැප්තා (මෙට්‍රික් ටොන්) .. | — | — | 115,416 | 11,207·0 | 77,210 | 6,039·0 |
| දැවි තෙල් ,, .. | — | — | 161,105 | 8,216·0 | 35·000 | 2,499·0 |
| ඉන්ධන සැපයීම් ,, .. | — | — | ල. නො. | ල. නො. | ල. නො. | 86,500·0 |
| 7. රාජ්‍ය ලෝහ භාණ්ඩ | | | | | | |
| කප්පාදු පිහි (ගණන්) .. | — | — | — | — | 3,924 | 13·0 |
| කෝපි සහ තේ කප්පාදු | | | | | | |
| පිහි (ගණන්) . | — | — | 2,400 | 7·8 | — | — |
| උදළු (ගණන්) .. | — | — | 100 | ·3 | — | — |
| රීයම් බෝල (ටොන්) .. | — | — | 50 | 40·2 | — | — |
| එකතුව .. | | 6,768 2 | | 9,803·9 | | 105,299·6 |

මූලය: කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යාංශය අදාළ සංස්ථා.

* ඛනිජ තෙල් සංස්ථාව මගින් සැපයූ දත්තයන්.

† ඝන මීටර්.

## 3. රාජ්‍ය අංශයෙහි කර්මාන්ත

### (1) ආහාර පාන වර්ග සහ දුම් කොළ

### (අ) ජාතික කිරි මණ්ඩලය

ජාතික කිරි මණ්ඩලය මගින් කරන ලද ප්‍රාග්ධන ආයෝජනය වූ රුපියල් දශ ලක්ෂ 29.7, 1971 වර්ෂයේදීද නොවෙනස්ව පැවතුනි. 1970 දී රුපියල් දශලක්ෂ 54.7 දක්වා රුපියල් දශලක්ෂ 8.8 කින් වැඩිවූ මණ්ඩලයේ මුළු නිෂ්පාදන වටිනාකම 1971 දී රුපියල් දශලක්ෂ 61.4 දක්වා වැඩිවේ යයි ඇස්තමේන්තු කොට ඇත. 1970 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 1.4 ක ලාභය හා සලකන කල්හි 1971 දී නිෂ්පාදනය වැඩිවීම හේතුකොට ගෙන මණ්ඩලයට රුපියල් දශ ලක්ෂ 6.8 ඇස්තමේන්තුගත ලාභයක් ලැබී ඇත.

### (ආ) ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය

1957 වර්ෂයේදී ආසන්න වශයෙන් ටොන් 1000 ක්වූ සත්ව ආහාර නිෂ්පාදනය 1969/70 වන විට ටොන් 51,000 දක්වා වැඩි වුවද 1970/71 දී ටොන් 48,839 දක්වා අඩුවී ඇත. මෙය 81.4% ක ධාරිතා උපයෝගිකරණයක් පෙන්නුම් කරයි. අනෙක් අතට මේද අම්ල නිෂ්පාදනය 1969/70 වර්ෂයේදී ටොන් 695 ක් සිට 1970/71 වර්ෂයේදී ටොන් 1057 දක්වා වැඩිවූ අතර මෙම කාල පරිච්ඡේදය තුළදී ග්ලිසරින් නිමැවුම ටොන් 73 සිට ටොන් 126 දක්වා වැඩි විය. පසුව සඳහන් නිෂ්පාදන දෙවර්ගය අපනයනය කිරීමෙන් සංස්ථාව රුපියල් දශ ලක්ෂ 2·7 ක විදේශ විනිමයක් ඉපයීය.

දේශීය කුකුළන් ඇතිකිරීමේ කර්මාන්තය දිරිගැන්වීම් වස් සංස්ථාවේ සත්ව ආහාර විකුණුම් මිල විවෘත වෙළෙඳ පොලේ මිළට වඩා අඩුවෙන් පවත්වා ගෙන යාමට අවශ්‍යව ඇති නිසා ඒ සඳහා 1967 සිට සංස්ථාවට රජයෙන් සහනාධාර මුදල් ලැබෙයි. දැනට සංස්ථාවේ අනුදත් ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 27.6 ක් වුවද, නිෂ්පාදනය සඳහා යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 18.4 කි. 1970/71 වර්ෂයේදි සංස්ථාව රුපියල් 120,000/- ක ලාභයක් ලැබූ අතර එහි ප්‍රාග්ධන ඵලය වූයේ සියයට 0·7 කි. සැසඳුම් කාර්යයන් සඳහා සංස්ථාවේ ලාභ ගණනය කිරීමේදී, 1969/70 සිට රජයෙන් දෙනු ලැබූ දීමනාවන් ඇතුළත් කොට නොමැති බව සැලකිල්ලට ගත යුතුය.

### (ඇ) ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාවෙන්, දැක්වූ පරිදි සංස්ථාව මගින් සීනි වලින් ලැබූ අලාභය ස්පිරිත්තු වලින් ලත් ආදායමෙන් සහ 1969/70 දී වූ රුපියල් දශ ලක්ෂ 11.1 ක මුළු ලාභයෙන් තවදුරටත් සමබර කර ගන්නා ලදී. 1970/71 මුදල් වර්ෂයට අදාළ සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොහැකිවූ බැවින් මෙම කාලපරිච්ඡේදය තුළ සංස්ථාවේ කටයුතු විමර්ෂණය කිරීම කළ නෙ හැකිය.

### (ඈ) ලංකා රජයේ පිටි නිෂ්පාදන නීතිගත සංස්ථාව

1964 මාර්තු 12 දින පිහිටුවනු ලැබූ රජයේ පිටි නිෂ්පාදන නීතිගත සංස්ථාව 1969 දී වාණිජ නිෂ්පාදනය ඇරඹීය. 1970/71 වර්ෂය තුළදී ටොන් 48,028 ක්වූ පිටි නිෂ්පාදනය සියයට 13 කින් වැඩි විය. මෙම නිෂ්පාදන ප්‍රමාණය සඳහා නිෂ්පාදන ධාරිතාවෙන් සියයට 95.3 ක් උපයෝගී කොට ගත් බව පෙන්නුම් කරයි. එසේම නිවුඩු, රුලං, පරළු සහ මත්ස්‍ය ආහාර ඇතුළු එහි අතුරු නිෂ්පාදනයන්හි සමානුපාතික නිපැයුම් වර්ධනයක් ඇතිවූ අතර එම නිෂ්පාදන ද්‍රව්‍යයන්හි වටිනාකම රුපියල් දශලක්ෂ 5.5 කින් රුපියල් දශලක්ෂ 36.1 දක්වා වැඩි විය. 1971 මුල් නව මස තුළ ටොන් 8107 ක නිවුඩු සහ පරළු අපනයන කිරීමෙන් රුපියල් දශලක්ෂ 3.3 ක විදේශ විනිමයක් සංස්ථාව උපයා ගන්නා ලදී. බදු අය කිරීමට පෙර ලාභ 1969/70 දී රුපියල් 235000 සිට 1970/71 දී 162000 දක්වා අඩු විය. නිෂ්පාදනය සඳහා යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 26·5 ක් වූ අතර 1970/71 දී ඵලද අනුපාතිකය සියයට 0·61 ක් විය.

---

1· 1970 වාර්ෂික වාර්තාව 67 වන පිටුව.

**(ඉ) ජාතික ලුණු සංස්ථාව**

ඉකුත් වර්ෂය හා සසඳන කල ලුණු නිෂ්පාදනය, අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම නිසා 1970/71 දී ටොන් 46478 කින් නොහොත් සියයට 42 කින් ටොන් 63354 දක්වා තියුණු ලෙස පහත වැටිණි. සංස්ථාව මගින් අඛණ්ඩව තොග එක්රැස් කර ගෙන තුබූ බැවින් එම තොග ප්‍රයෝජනයට ගැනීමෙන් දේශීය ඉල්ලුම සපුරාලීමට සංස්ථාවට හැකිවිය.

සංස්ථාව, 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 2.8 ක ලාභයක් ලැබූ අතර 1970/71 වර්ෂයේදී ඉපයූ ලාභය රුපියල් දශලක්ෂ 2 3 කි. මින් සියයට 22·9 යේ අනුපාතිකයේ ප්‍රාග්ධන ඵලයක් පිළිබිඹු කැරෙන අතර ඉකුත් වසරේදී එම අනුපාතිකය 28·1 ක් ව පැවතිණි. විකුණුම් ප්‍රමාණය වැඩි වූයේ වුවද, 1970/71 දී වූ ලාභය පහළ යාමට ප්‍රධාන හේතුව වූයේ වැටුප් ඉහළ යාමය. මේ අතර 1971/72 පළමු කාර්තු දෙකෙහි උපනතිය අනුව, මෙම වර්ෂයේ නිෂ්පාදන ඉලක්කවල ඌනතාවයක් පෙන්නුම් කරයි.

**(2) රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තය**

**(අ) ජාතික පේෂ කර්ම සංස්ථාව**

1970/71 දී සංස්ථාවෙහි මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 48·4 කින් රුපියල් දශලක්ෂ 282.3 දක්වා වැඩි විය. මෙයින් රුපියල් දශලක්ෂ 47·1 ක් තුල්හිරියේ පිහිටි නව පේෂ කර්ම කම්හල සඳහා ආයෝජනය කොට ඇතත් 1970/71 දී වාණිජමය නිෂ්පාදනයන් එහි නොකෙරිනි. ඉකුත් වර්ෂය හා සසඳන කළ 1970/71 වර්ෂය තුළ සංස්ථාවේ නූල් සහ රෙදි පිළි නිෂ්පාදනය අඩු විය. මෙ අතර මුල් කාර්තු දෙකේ උපනතිය අනුව 1971/72 නිෂ්පාදනය ඉකුත් වර්ෂයට වඩා වැඩි විය හැකි බැව් පෙනේ.

පිරිවැටුමෙ වැඩිවීමක් සිදුවුවද 1969/70 දී නිෂ්පාදන කටයුතුවලින් ලැබූ රුපියල් දශලක්ෂ 2 8 මුළු ලාභය හා සසඳන කළ සංස්ථාව රුපියල් දශලක්ෂ 0.07 ක පාඩුවක් විඳින ලදී. මෙයට බොහෝ සෙයින් හේතු වූයේ වඩා වැඩි වැටුප් පිරිවැයයි වේයන්ගොඩ පේෂ කර්ම කම්හලෙහි නිමැවුම පහත යාම, වඩා වැඩි අලාභවලින් පිළිබිඹු විය. ආනයනය කරන ලද නූල් අලෙවි කිරීමෙන් ලැබූ ඉහළ ගිය ලාභයෙන් යථෝක්ත අලාභයෙන් කොටසක් පියවා ගැනීමට හැකි විය. නූල් ආනයනය අංශය රාජ්‍ය නූල් කැටීමේ සැපයුම් සංස්ථාව වෙත පවරා ඇති බැවින් 1971/72 දී සංස්ථාවට එම වාසිය අහිමිවනු ඇත.

**(ආ) ලංකා සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය**

ක්‍රෝම් හම් නිෂ්පාදන ධාරිතාව දෙගුණයක් කරන තරම් වන නව සම් පදම් කිරීමෙ කම්හලක් ගොඩ නැගීම නිසා, 1970/71 දී මෙම සංස්ථාවේ මුළු ආයෝජනය රුපියල් දශලක්ෂ 4.1 කින් රුපියල් දශලක්ෂ 14.9 දක්වා වැඩි විය. පාවහන් හැර අනෙක් සියළු නිෂ්පාදන භාණ්ඩවල නිමැවුමෙ වැඩිවීමක් 1970/71 දී දක්නට ලැබිණ. නිෂ්පාදනය දේශීය වෙළෙඳ පොළේ ඉල්ලුම සඳහා යොමුකර තිබීමත් 1970 දී පාවහන් තොග විශාල වශයෙන් රාශිකරණය කර තිබීමත්, සංස්ථාවේ පාවහන් කම්හලෙහි මුළු ධාරිතාවෙන් සියයට 66 ක් ක්‍රියාත්මක වීමට හේතු විය. 1970/71 දී පාවහන් හා සම් භාණ්ඩ අපනයනයන් සිදුනොවිය 1968/69 දී රුපියල් 7,84,300 ක්වූ අපනයන වටිනාකම 1969/70 වර්ෂයේදී රුපියල් 33,300 දක්වා තියුණු අන්දමින් අඩුවී ඇති බව මෙහිලා සැලකිය හැකිය.

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 1970/71 වර්ෂයේ දී වූ නිෂ්පාදන වටිනාකම ඉකුත් වර්ෂයේ ප්‍රමාණයෙන් සියයට 81 ක් වුවද ගොඩගැසී තුබූ තොග විකුණා දැමීම සඳහා යොදගත් දැඩි අලෙවි වර්ධන ව්‍යාපාරය නිසා විකුණුම් සියයට 6 කින් වැඩි විය. 1971/72 දී නිෂ්පාදනය හා අලෙවිය සැහෙන ප්‍රමාණයකින් වැඩි කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. එසේ වුවද 1971/72 මුල් කාර්තු දෙකේ උපනතිය අනුව, සියළුම නිෂ්පාදනයන්හි අඩුවීමක් දක්නට ඇත.

මෙම සංස්ථාව 1968/69 වර්ෂයේදී රුපියල් 1,68,000/- ලාභයක් (හෝ එහි ප්‍රාග්ධනයෙන් සියයට 2.7) ඉපයුවද ඊට පසු වර්ෂයේදී පාඩු විඳින ලදී 1970/71 දී ලැබූ අලාභය ඊට පෙර වර්ෂයේ ලද අලාභය මෙන් පස් ගුණයක් විය. සේවා නියුක්ති සංඛ්‍යාව 1969/70 දී 690 සිට වසර තුලදී 864 දක්වා වැඩි විය. දේශීය අමු ද්‍රව්‍ය උපයෝගීකරණය 1967/68 දී සියයට 38 සිට 1970/71 දී සියයට 69.4 දක්වා වැඩි විය.

(3) දැව සහ දැව නිෂ්පාදිත

(අ) ලංකා තුනී ලැලි සංයුක්ත මණ්ඩලය

වසරකට, වර්ග අඩි දශ ලක්ෂ 30 ක පතු 3 නෝ තුනී ලැලි නිෂ්පාදන ධාරිතාවයක් ඇති ගිංතොට කම්හලෙහි 1970/71 දී විඩ තුනක් සේවය කොට වර්ග අඩි දශලක්ෂ 24 ක් නිෂ්පාදනය කරන ලදී. මෙයින් දළ වශයෙන් ධාරිතාවෙන් සියයට 80 උපයෝගී කරණයක් පිළිබිඹු වෙයි. තේ පෙට්ටි ලැලි නිෂ්පාදනය 1969/70 දී 902,000 ක් වූ අතර 1970/71 දී එය 10,43,000 දක්වා වැඩි විය. තුනී ලැලි මට්ටම් පනෙල් දොරවල් සහ බ්ලොක් ලැලි නිෂ්පාදනයද වැඩිවූ අතර 1970/71 දී එහි නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 11.4 ක් විය. මෙය සංස්ථාව ආරම්භ කිරීමෙන් පසු ඇතිවූ ඉහළම නිෂ්පාදන වටිනාකමයි. නිෂ්පාදන වටිනාකම මෙසේ වැඩිවී තිබියදීත් අලෙවිය රුපියල් දශලක්ෂ 3 කින් වැඩිවී තිබියදීත්, 1969/70 වර්ෂයේදී ඉපැයූ ලාභය රුපියල් දශලක්ෂ 0.6 සිට 1970/71 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 0.1 දක්වා පහත වැටුණි. සේවක අර්ථසාධක අරමුදල සඳහා වන දායක දීමනා සියයට 6 සිට 15 දක්වා වැඩි කිරීමත්, සංස්ථා සේවකයන් සඳහා ප්‍රතිශෝධිත වැටුප් ව්‍යුහයක් ඇති කිරීමත්, ලාභය පහත වැටීමට තුඩු දුන් හේතූන් හැටියට දැක්විය හැකිය. සංස්ථාවේ සේවක සංඛ්‍යාව, 1969/70 දී 1199 සිට 1970/71 දී 1226 දක්වා වැඩි විය.

සංස්ථාව, 1970/71 වර්ෂයේදී තුනී ලැලි ඝන මීටර් 370.5592 අපනයනය කොට රුපියල් 312,500/- ක විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගන්නා ලදී. 1971 මාර්තු 31 වැනි දින තෙක් සංස්ථාව විසින් නිෂ්පාදනය සඳහා යොදන ලද ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7.05 ක් විය. මෙහි සියයට 1.57 අනුපාතිකයක ප්‍රාග්ධන ඵලයක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය සියයට 9.8 ක් විය.

(ආ) රාජ්‍ය දැව සංස්ථාව

මූලික වශයෙන් දැව ලබා ගැනීම, ඉරීම සහ අලෙවිය යන කාර්යයන්හි යෙදීමට සහ දැව ලබා ගැනීම සඳහා යාන්ත්‍රික ඒකකයන් පිහිටුවීම සඳහා 1968 දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාපනය කරන ලදී. දැව ලබා ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන් අතර ඇති කර ගන්නා ලද සියළුම කොන්ත්‍රාත්තුද, දැව ලබා ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාවිච්චියට ගන්නා ලද සියළුම උපකරණද, ඉරුම් මෝල්, දැව අලෙවි ඩිපෝ යනාදියද සංස්ථාව විසින් පවරා ගන්නා ලදී.

1970/71 තුළ එහි නියම ක්‍රියාකාරිත්වය පිළිබඳ සංඛ්‍යා තොරතුරු සහ 1971/72 සඳහා අයවැය ගත සංඛ්‍යා ලබාගත නොහැකි විය.

(4) කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත මුද්‍රණ සහ ප්‍රකාශන

(අ) නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

වාලච්චේනෙයි කම්හලෙහි වැඩි කරන ලද ධාරිතාවඋපයෝගී කර ගැනීම නිසා 1970/71 වර්ෂයෙහි කඩදාසි නිෂ්පාදනය ඉකුත් වර්ෂයට වඩා ඉහළ ගොස් ඇත. මේ අතර ආනයන කපා හැරීමක් අතිරික්ත තොග තිබීම නිසාත් කඩදාසි ආනයනය අඩුවී ඇති බවක් පෙනේ. නිෂ්පාදනය කළ හා ආනයනය කළ කඩදාසි වල අලෙවි වටිනාකම 1970/71 දී වැඩි වුවද, සේවක වැටුප් බිල වැඩිවීම නිසා ලාභයේ ආන්තික අඩුවීමක් දැක්විණි. 1971/72 වර්ෂය සඳහා වැඩි නිමැවුමක් ඇස්තමේන්තු කර ඇත. එසේ වුවද පළමු කාර්තු දෙකේ නිෂ්පාදන

රටාව අනුව බලන කල මුළු නිෂ්පාදනය, නියමිත ඉලක්කයට වඩා අඩු වියහැකි බැව් පෙනේ. සංස්ථාවේ මුළු ආයෝජනය 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 20 කින් රුපියල් දශලක්ෂ 83.9 දක්වා වැඩිවී ඇත. වාලච්චෙනෙයිහි පිහිටි කඩදාසි බෝඩ් කම්හල සඳහා කරන ලද ආයෝජනය මෙම වැඩිවීමට හේතු විය. යොදවා ගන්නා ලද ප්‍රාග්ධනයේ ඵලය සියයට 9.3 නේ අනුපාතිකයේ විය.

**(ආ) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**

1970/71 වර්ෂයේ ප්‍රාග්ධනයට එකතුවක් වශයෙන් රුපියල් දශලක්ෂ 2·8 වටිනා යන්ත්‍රෝපකරණ රජයේ මුද්‍රණාලයෙන් සංස්ථාව වෙත පවරන ලදී. මුළු ප්‍රාග්ධන ආයෝජනය 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 3.4 කින් රුපියල් දශලක්ෂ 10·8 දක්වා වැඩි විය සංස්ථාව 1970 ඔක්තෝබර් මාසයේදී වාණිජමය නිෂ්පාදනය අරඹන ලදී. මුල් සමය තුළ නිෂ්පාදන කටයුතු වලින් සංස්ථාවට රුපියල් 692,837 ක අලාභයක් වී ඇත.

**(5) රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත**

**(අ) පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය**

මුළු ධාරිතාවෙන් සියයට 90 ක් නියෝජනය කරමින් ටොන් 1375 ක් දක්වා සියයට 62 කින් ඉකුත් වසර ඉක්මවා නිමැවුම වැඩිවූ හෙයින්, 1966/67 සිට කෝස්ටික් සෝඩා නිෂ්පාදනයේ දක්නට තුබූ අඩුවන ප්‍රවනතාවය, 1970/71 දී අත්හිටවිනි. ක්ලෝරීන් නිෂ්පාදනයද 1969/70 දී ටොන් 505 සිට 1970/71 දී ටොන් 576 දක්වා වැඩිවී ඇත. සමාලෝචනයට භාජනය වී ඇති මෙම වර්ෂය තුළදී සංස්ථාව කැල්සියම් ක්ලෝරයිඩ් නිෂ්පාදනයද ආරම්භ කරන ලදී. කලින් අත්හද බැලීමේ පදනමක් මත නිෂ්පාදනය කල හයිඩ්‍රොක්ලෝරික් අම්ලය වෙළෙඳාම සඳහා නිෂ්පාදනය කෙරේ. රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මින් ටොන් 192 ක මුළු නිෂ්පාදනය ප්‍රමාණවත් වෙයි.

1970/71 වර්ෂයේදී මුළු නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 2.8 සිට රුපියල් දශලක්ෂ 3.1 දක්වා වැඩිවූ අතර මුළු අලෙවි වටිනාකම දළ වශයෙන් රුපියල් 7,01,000 කින් වැඩි විය. සංස්ථාවේ ලාභය 1969/70 දී රුපියල් 240,027 සිට 1970/71 දී රුපියල් 648,054 දක්වා වැඩි විය. මෙහි ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයේ ඵලය සියයට 5.5 ක්ය.

ආනයනය කරන ලද කෝස්ටික් සෝඩා වල මිල ටොන් එක පවුම් 28 සිට පවුම් 60 දක්වා සීඝ්‍රයෙන් ඉහළ යැම නිසා සිය කෝස්ටික් සෝඩා කැට සහ කෝස්ටික් සෝඩා වතුර වල විකුණුම් මිල පිළිවෙලින් ටොන් එකක් රුපියල් ·1600 සහ රුපියල් 1700 දක්වා වැඩි කිරීමට සංස්ථාවට සිදු විය.

**(ආ) ලංකා ටයර් සංස්ථාව**

1967 දී සංස්ථාව විසින් වාණිජමය නිෂ්පාදනය ඇරඹීමත් සමගම සිය නිමැවුම සහ වාණිජමය ලාභදායකත්වය වැඩි කර ගන්නා ලදී. ප්‍රථම නිෂ්පාදන වර්ෂය වන 1967/68 දී ටයර් නිෂ්පාදනය 57622 සිට 1970/71 දී 84342 දක්වා වැඩිවූ අතර, අනුරූප කාලපරිච්ඡේදය සඳහා ටියුබ් නිෂ්පාදනය 62062 සිට 99325 දක්වා වැඩි විය. එසේ වුවද සමාලෝචනයට භාජනය වී ඇති මෙම වර්ෂය තුළ ටයර් සහ ටියුබ් නිෂ්පාදනය නියමිත ඉලක්කයනට වඩා අඩු විය. ධාරිතා උපයෝගිකරණය පහත් මට්ටමකම පැවතුන අතර එය තව දුරටත් ටයර් සඳහා සියයට 33.6 ක්ද ටියුබ් සඳහා සියයට 65.3 ක්ද විය. ධාරිතා උපයෝගිකරණය මෙසේ පහත් මට්ටමක තිබීමට හේතු වූයේ නිෂ්පාදන කටයුතු සඳහා සීමිත කාණ්ඩ කීපයක ටයර් ප්‍රමාණයන්හි අච්චු පමණක් සංස්ථාවට තිබීමය. එම කාණ්ඩ සංඛ්‍යාව 1970/71 වර්ෂයේ 11 ක්වූ අතර ඉකුත් වසරේදී 6 ක් විය.

මුළු නිෂ්පාදන වටිනාකම 1967/68 දී රුපියල් දශලක්ෂ 11.3 ක්වූ අතර 1970/71 දී එය රුපියල් දශලක්ෂ 43.5 දක්වා වැඩි විය. සමාලෝචනයට භාජනය වන මෙම වර්ෂය තුළ උපයන ලද ලාභය බදු ගෙවීමට පෙර රුපියල් දශලක්ෂ 6.2 ක්වූ අතර මෙය ඉකුත් වර්ෂයට

වඩා සියයට 15 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. විකුණුම් මිලෙහි වැඩි කිරීමක් සිදු නොකොටම වාණිජමය ලාභදායකත්වය වැඩි කිරීමට හැකිවී ඇත. වර්ෂය තුළදී ආයෝජනය කරන ලද රුපියල් දශලක්ෂ 67.5 ක්වූ ප්‍රාග්ධනයේ ඵලය සියයට 9 ක් විය.

(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

තෙල් පිරිපහදුව

1971 වර්ෂය තුළදීද පිරිපහදුව සඳහා කරන ලද ප්‍රාග්ධන ආයෝජනය වූ රුපියල් දශලක්ෂ 186 එසේම පැවතුණි. පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය 1971 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1.7 සිට 1.4 දක්වා පහත වැටිණ. නඩත්තු කිරීමේ කටයුතු නිසා ප්‍රිමියම මෝටර් ගැසොලින් නිෂ්පාදනය 1971 ජනවාරි, පෙබරවාරි යන මාසවලදී අත්හිටුවන ලදී. අලෙවිය ඉතා පහත වැටීම නිසා බිටුමන් නිෂ්පාදනයද 1971 සිට අඩු කරනලදී. තවද දෙසතියක කාලසීමාවක් තුළ පැවැති වැඩ වර්ජනයද තෙල් පිරිපහදුවේ නිෂ්පාදන කටයුතු කෙරෙහි බලපෑමක් ඇති කෙළේය.

1971 වර්ෂය තුළදී විදේශ විනිමය වශයෙන් රුපියල් දශලක්ෂ 8.4 ක් පමණ වටිනා නැප්තා, දැවි තෙල් සහ ඉන්ධන තෙල් අපනයනය කරන ලදී. පිරිපහදුවේ ලාභාලාභ පිළිබඳ සංඛ්‍යා ලබා ගත නොහැකි විය.

ලිහිස්සි තෙල් මිශ්‍රණ යන්ත්‍ර පට්ටලය

මෙම යන්ත්‍ර පට්ටලයේ මුළු ප්‍රාග්ධන ආයෝජනය 1970 දී රුපියල් දශලක්ෂ 5.5 හි පැවැතිණි. ගැලුම් දශලක්ෂ 45 ධාරිතාවක් ඇති මිශ්‍රණ යන්ත්‍ර පට්ටලය විසින් රුපියල් දශලක්ෂ 4.7 ක ලාභයක් උපයමින් ලිහිස්සි තෙල් ගැලුම් දශලක්ෂ 3.8 ක් 1971 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද අතර ඉකුත් වර්ෂයේදී මෙහි ලාභය රුපියල් දශලක්ෂ 3.2 ක් විය. ලිහිස්සි තෙල් කම්හලෙහි ප්‍රාග්ධන ඵලය 1971 දී සියයට 86 ක් වූ අතර එය 1970 වර්ෂයේදී සියයට 58 ක් විය.

(ඈ) ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

1969 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම සංස්ථාව, එම වර්ෂයේ ජූලි මසදී, ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අංශයේ කාර්යයන් පවරා ගන්නා ලදී. 1970/71 වර්ෂයේදීද ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 1.4 ක් විය 1969/70 වර්ෂයේදී මුළු නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 1.1 ක්වූ අතර මෙම වර්ෂය තුළදී එය රුපියල් දශලක්ෂ 1.2 දක්වා වැඩි විය. 1970/71 වර්ෂයේදී සංස්ථාව රුපියල් 1,33,000 ක ලාභයක් උපයන ලදී ඉකුත් වර්ෂයේදී සංස්ථාව ලද ලාභය රුපියල් 1,30,000 ක් විය. 1970/71 දී ප්‍රාග්ධන ඵලය සියයට 9.7 ක අනුපාතයේ විය.

(ඉ) රජයේ පොහොර නිපදවීමේ නීතිගත සංස්ථාව

1966 දී පිහිටුවන ලද මෙම සංස්ථාව යූරියා නිෂ්පාදනය පිණිස දවසකට ටොන් 864 ක ධාරිතාවක් ඇති කම්හලක් ඉදි කිරීමට නියමිතය. සපුගස්කන්දේ පිහිටා ඇති තෙල් පිරිපහදුවේ දැනට අපනයනය කරන නැප්තා නමැති අතුරු නිෂ්පාදනය මේ සඳහා ගනු ලබන ප්‍රධාන අමු ද්‍රව්‍යය වනු ඇත. කම්හල 1975 දී පමණ නිෂ්පාදන කටයුතු ආරම්භ කරනු ඇත.

1971 මාර්තු මස 31 වැනි දිනට සංස්ථාව සඳහා වූ අනුදත් ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂ 346 ක් විය. රජයෙන් කරන ලද ප්‍රාග්ධන දීමනාව රුපියල් දශලක්ෂ 49.5 කි. කම්හල් බිම සකස් කිරීම යනාදිය සඳහා නියම වශයෙන් වැයවූ මුදල රුපියල් දශලක්ෂ 9.7 කි.

(6) ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් නිෂ්පාදන හැර)

(අ) ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

1970/71 වර්ෂයේදී මීගමුව, බොරලැස්ගමුව කම්හල් සහ පිළියන්දල පවිත්‍රතා භාණ්ඩ නිෂ්පාදන අංශ වල නිෂ්පාදනය නියමිත ඉලක්කය දළ වශයෙන් සියයට 8 කින් ඉක්මවා තිබුණි. ඇත්ත වශයෙන්, පවිත්‍රතා භාණ්ඩ අංශයේ ටොන් 543 ක නිෂ්පාදනයක් වාර්තාවී

ඇති අතර එය සිය ධාරිතාවට වඩා සුළු වශයෙන් වැඩි වීමකි. පිඟන්මැටි පිරිපහදුවේ නිෂ්පාදනය පසුගිය අවුරුද්දේ නිෂ්පාදනයට වඩා වැඩිවුවද වෙළෙඳ පොලේ පැවැති සීමිතකම් නිසා ධාරිතාවට වඩා නිෂ්පාදනය සියයට 28 කින් අඩුය. අනෙක් අතට පිළියන්දල පිඟන් කෝප්ප සහ පිඟන් ගඩොල් අංශ වල නිෂ්පාදනය නියමිත ඉලක්ක වලට වඩා පිළිවෙලින් සියයට 13 කින් සහ සියයට 19 කින් අඩු විය. ප්‍රධාන පෙළේ අළුත්වැඩියා කිරීම් සඳහා උඳුන් වසා තිබීම මූලික වශයෙන් මීට හේතු වන්ට ඇත.

අලෙවි වටිනාකම 1969/70 දී රුපියල් දශලක්ෂ 12.9 සිට 1970/71 දී රුපියල් දශලක්ෂ 16.1 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩිවීම හේතුකොට ගෙන පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 3·3 ක වැඩි ලාභයක් උපයා ගතහැකි විය.

සංස්ථාව විසින් යොදවා ගන්නා ලද මිල ප්‍රතිපත්තියවී ඇත්තේ, මිල වැඩි කිරීමෙන් ලාභ ලබා ගැනීමට වඩා පිරිවැටුම වඩා විශාල කිරීමෙන් ලාභ ලබා ගැනීමය ඒ අනුව දෛනික පාවිච්චිය සඳහා උපයෝගී කර ගන්නා භාණ්ඩ වලට අඩු මිලක් නියම කර ඇති අතර විසිතුරු භාණ්ඩ සඳහා වැඩි මිලක් නියම කර ඇත. සාමාන්‍ය වශයෙන් ගත් කල අලෙවියෙන් ලත් ආන්තික ලාභය පිඟන් භාණ්ඩ සඳහා සියයට 15 ක් පමණද, පවිත්‍රතා උපකරණ භාණ්ඩ සඳහා සියයට 15 ක්ද, පිඟන් ගඩොල් සඳහා සියයට 29 ක්ද පිඟන්මැටි සඳහා සියයට 3 ක්ද වෙයි. අඟල් 4 තේ පීරිසි 500,000 ක් පමණ අපනයනය කිරීමෙන් විදේශීය විනිමය වශයෙන් සංස්ථාවට රුපියල් 85,823 ක් උපයා ගැනීමට හැකිවී ඇත. 1960 සිට නොකඩවාම ලාභ උපයන්නට වූ මෙම සංස්ථාව රුපියල් දශලක්ෂ 19.9 ක් වූ ආයෝජිත ප්‍රාග්ධනයෙහි ඵලය සියයට 16 ක් වශයෙන් දක්වීය.

(ආ) ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

සංස්ථාවේ මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 58.4 සිට 1970/71 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 244.1 දක්වා වැඩි විය. සමාලෝචනයට භාජනයවී ඇති මේ වර්ෂය තුළදී පුත්තලම් කම්හලේ පළමු අදියරේ නිෂ්පාදන කටයුතු ආරම්භ විය. මුළු සිමෙන්ති නිෂ්පාදනය 1969/70 වර්ෂයේ ටොන් 268338 සිට 1970/71 වර්ෂයේ ටොන් 351816 දක්වා වැඩිවිය. නමුත් කන්කසන්තුරේ කම්හලේ ක්ලින්කර් නිෂ්පාදනය තරමක් අඩුවිය. එසේ වුවද, වැඩි පිරිවැටුම නොතකාම 1970/71 දී සංස්ථාව ඉපයූ ලාභය ආන්තික වශයෙන් පහත වැටුණි. මේ අතර ප්‍රාග්ධන ඵලය සියයට 12.9 ක් විය. නිෂ්පාදනයේ හා අලෙවියේ ඇස්තමේන්තුගත උසස් මට්ටම් අනුව 1971/72 දී සිය ලාභය සැලකියයුතු පරිදි වැඩිකරගත හැකිවනු ඇතැයි සංස්ථාව අපේක්ෂා කරයි. මුල් කාර්තු තුනේ නිෂ්පාදන ප්‍රවනතාවයන් අනුව බලන කල පසුගිය වර්ෂයට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කළහැකි බැව් පෙනේ.

1970/71 වර්ෂයේ රුපියල් දශලක්ෂ 4 ක ලාභයක් දක්වූ පුත්තලම් කම්හලේ පළමු අදියර 1971/72 වර්ෂයේදී සිය ලාභය තෙගුණයකින් වැඩිකර ගනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

(ඇ) ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

සංස්ථාවේ මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 1·27 කින් රුපියල් දශලක්ෂ 26.13 දක්වා 1970/71 වර්ෂයේදී වැඩි විය. එකී ආයෝජනයන් වැඩිවීම මුළුමනින්ම උළු සහ ගඩොල් කර්මාන්ත ශාලා සඳහා උපයෝගී කරගෙන ඇත. මේ අතර සමාලෝචනයට භාජනව ඇති මෙම වසර තුළදී සංස්ථාව බීඩි නිෂ්පාදනයෙහි යෙදී ඇත. තවද බීඩි කොළ ආනයනය හා බෙදහැරීමද නිපයූ බීඩි අලෙවියද සංස්ථාව යටතට ගන්නා ලදී.

නිෂ්පාදන වටිනාකම 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 8.3 සිට 1970/71 දී රුපියල් දශලක්ෂ 9.67 දක්වා රුපියල් දශලක්ෂ 1.6 කින් වැඩිවී ඇත. එසේ වුවද අලෙවි වටිනාකමෙහි ආන්තික වැඩිවීමක් තිබියදීත් සංස්ථාවේ පාඩුව සැලකිය යුතු අන්ද

මින් වැඩිවී ඇත අභ්‍යන්තර මිල ගණන් වලට විවිධ දෙපාර්තමේන්තුවලට කෙරෙන විකුණුම් නිසා වඩු කර්මාන්ත අංශය දිගින් දිගටම අලාභ ලබා ඇත. 1971/72 දී විශේෂයෙන්ම වඩුකර්මාන්ත අංශයෙහි වූ පාඩුව වැඩිවෙයයි බලාපොරොත්තු වේ පළමු කාර්තුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව දිස්වෙන කරුණු අනුව, නිෂ්පාදනය සහ අලෙවිය නියමිත ඉලක්කයනට වඩා තරමක් අඩුවෙන් සිදුවෙන බවක් පෙනේ.

(ඇ) ලංකා බනිජවැලි සංයුක්ත මණ්ඩලය

මෙම සංස්ථාවේ ආයෝජිත ප්‍රාග්ධනය 1970/71 දී රුපියල් දශලක්ෂ 16.22 දක්වා රුපියල් දශලක්ෂයකින් වැඩි විය. සාමාන්‍ය වශයෙන් ගත් කළ මේ සංස්ථාවේ සෑම අංශයකම පාහේ නිෂ්පාදනය වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඉල්මනයිට් නිෂ්පාදනය පළමු අවුරුද්දට වඩා ටොන් 15000 කින් නැතහොත් සියයට 19 කින් වැඩිවී ඇති අතර දළ වශයෙන් මෙය සියයට 95 ධාරිතා උපයෝගිකරනයක් පිළිබිඹු කරයි මේ අතර සංස්ථාව පළමු වරට, ටොන් 121 ක් වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලදී. ඉල්මනයිට් අපනයනය 1970/71 වර්ෂයේදී සැළකිය යුතු පරිදි වැඩිවී ඇති අතර, 1971/72 දී මෙය තවත් වැඩිවෙයයි බලාපොරොත්තු වේ. පළමු හය මාසයේ නිෂ්පාදන උපනතිය අනුව බලන කළ මුළු නිෂ්පාදනය නියමිත ඉලක්කයන්ට අනුකූලව ක්‍රියාත්මක වේයයි බලාපොරොත්තු විය හැක. නිපැයුම හා අලෙවිය වැඩිවීම නිසා 1969/70 දී ලාභය වූ රුපියල් දශලක්ෂ 1.5, 1970/71 වර්ෂයේදි රුපියල් දශලක්ෂ 1.6 දක්වා වැඩිකර ගැනිමට සංස්ථාවට හැකි වී ඇත. මෙය, නිෂ්පාදනය සඳහා යොදවා ඇති ප්‍රාග්ධනයෙන් සියයට 10 ක ඵලයකි.

(7) මූලික ලෝහ කර්මාන්ත

(අ) ලංකා වානේ සංස්ථාව

1970/71 වර්ෂයේදී සංස්ථාවේ රෝල් හා වයර් නිෂ්පාදනයන්හි තරමක වර්ධනයක් ඇතිවූ අතර අලෙවිය වැඩි වූයේ හුදෙක් ආන්තික වශයෙනි. මේ අනුව මෑතක වාර්තා අනුව පෙනී යනුයේ, සංස්ථාවේ නිෂ්පාදනය හා අලෙවිය නියමිත ඉලක්කයන්ට වඩා අඩු ප්‍රමාණයකින් ක්‍රියාත්මක වෙමින් පවතින බවයි.

වානේ රෝල් කම්හල සහ වයර් කම්හල තව දුරටත් ඌනධාරිතාවයකින් ක්‍රියා කරනු ලැබේ. සංස්ථාවේ භාණ්ඩවල මිල වැඩි කාල් වී නමුදු ආනයන ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යාම නිසා පිරිවැය අධිකවීමේ හේතුවෙන් පසුගිය වර්ෂයේ ලාභ මට්ටම වත් රඳවා ගැනීමට සංස්ථාවට නොහැකිවී ඇත 1970/71 දී ඉපැයූ ලාභය රුපියල් දශලක්ෂ 1.434 ක්වූ අතර ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් දශලක්ෂ 2.186 ක් විය. මෙහි ප්‍රාග්ධන ඵලය සියයට 1.2 ක් විය.

(8) සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ

(අ) ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

මෙම සංස්ථාවේ නිෂ්පාදිත වටිනාකම, 1970/71 දී රුපියල් දශලක්ෂ 1.4 කින් රුපියල් දශලක්ෂ 5.2 දක්වා වැඩිවිය. එහෙත්, පෞද්ගලික අංශය හා තරඟ කිරීමට සිදුවී ඇති නිසා සංස්ථාවේ අලෙවිය ඉකුත් වර්ෂයේ අලෙවියට වඩා පහත වැටී ඇත. 1971/72 වර්ෂයේ සිය අලෙවි වටිනාකම සිව් ගුණයකටත් වඩා වැඩිකර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. 1971/72 මුල් භාගයේ ක්‍රියාකාරිත්වය අනුව සලකන කල්හි මෙම අලෙවි ඉලක්කය ලබාගත හැකි බැව් නොපෙනේ. කෙසේවතුදු 1971/72 මුල් කාර්තුවේ අලෙවි වටිනාකම ඉකුත් වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ අලෙවි වටිනාකමට වඩා බොහෝ සෙයින් වැඩිය සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂයේ මුල් හයමාසය තුළ රුපියල් දශලක්ෂ 3.573 ක අලාභයක් සංස්ථාවට සිදුවී ඇති අතර මේ වර්ෂයේ අලාභය ඉකුත් වසරේ අලාභයට වඩා අධික වනු ඇතැයි ඉන් පෙන්නුම් කැරිණි.

## 4. වෙනත් රාජ්‍ය ව්‍යවසායන්

### (1) කෘෂිකර්මය, වන සහ ධීවර

### (අ) ලංකා ධීවර සංස්ථාව

1970/71 දී සංස්ථාවේ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 84.1 සිට රුපියල් දශලක්ෂ 107.0 දක්වා වැඩි විය. මෙය සියයට 27 ක වැඩිවීමකි. සංස්ථාව විසින් අල්ලන ලද මාළු ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 4.4 සිට රාත්තල් දශලක්ෂ 5.7 දක්වා වැඩිවූ අතර මිළදී ගත් මාළු ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 1.7 සිට රාත්තල් දශලක්ෂ 4.5 දක්වා වැඩි විය. පසුගිය වර්ෂ කිහිපය මුළුල්ලේදීම සංස්ථාව දිගින් දිගටම පාඩු ලබන්නට විය. 1969/70 දී වූ පාඩුව රුපියල් දශලක්ෂ 11·8 ක් වූ අතර, 1970/71 දී ප්‍රතිඵල තවමත් තක්සේරු කොට නොමැත.

1969/70 වර්ෂය සඳහා මාළු රාත්තල් 4,14,848 අපනයනය කොට විදේශීය විනිමය වශයෙන් රුපියල් දශලක්ෂ 0·6 ක් ඉපයූ සංස්ථාව, 1970/71 වර්ෂයේදී මාළු රාත්තල් 3,63,948 අපනයනය කොට විදේශීය විනිමය වශයෙන් රුපියල් දශලක්ෂ 1.0 ක් උපයා ඇත.

### (ආ) ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

1969/70 දී ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය විසින් වතු 13 ක් සහ කම්හල් 4 ක් පාලනය කෙරිණි.

මණ්ඩලයේ ප්‍රාග්ධන ආයෝජනය 1965/66දී දී රුපියල් දශලක්ෂ 33.5 සිට 1966/67 රුපියල් දශලක්ෂ 39.2 දක්වා වැඩිවිය. 1967/68 දී එය රුපියල් දශලක්ෂ 32.0 දක්වා පහළ වැටුණු අතර නැවතත් 1968/69 දී රුපියල් දශලක්ෂ 36 3 දක්වා වැඩි විය. ප්‍රාග්ධන ආයෝජනය 1969/70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 38·4 හි පැවති අතර එයින් රුපියල් දශලක්ෂ 31.4 ක් වැවිලි කර්මාන්ත සඳහාද රුපියල් දශලක්ෂ 7 ක් කම්හල් සඳහාද යෙදවිනි. 1970/71 ඇස්තමේන්තු අනුව මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 40.9 දක්වා වැඩිවී ඇත.

වැවිලි කර්මාන්ත කටයුතුවල නියැලීමෙන් ලත් ආදයම, 1968/69 දී රුපියල් දශලක්ෂ 4·7 සිට 1969/70 දී රුපියල් දශලක්ෂ 44 දක්වා ආන්තික වශයෙන් පහත වැටුණු අතර එහි ලාභය රුපියල් 12,000 සිට රුපියල් 20,000 දක්වා වැඩි විය. 1970/71 ලාභය රුපියල් 548,000 වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අනෙක් අතට කම්හල් පාලනයෙන් සංස්ථාවට විඳින්නට වූ අලාභය 1968/69 දී රුපියල් 109,000 සිට 1969/70 දී රුපියල් 145,000 දක්වා වැඩි විය. 1970/71 දී පාඩුව රුපියල් 36,000 දක්වා අඩුවෙතැයි ඇස්තමේන්තු කොට ඇත. මණ්ඩලයේ කාර්යයන් සමස්ථයක් වශයෙන් ගත්කළ 1969/70 දී ලැබූ අලාභය රුපියල් 115,000 වන අතර ඉකුත් වසරේදී ලැබූ ලාභය රුපියල් 11,856 ක් විය.

### සංඛ්‍යා සටහන II (ඇ) 7

### රාජ්‍ය වැවිලි සංස්ථාව (අ)

| ශීර්ෂය | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
|---|---|---|---|---|---|
| 1. ආයෝජිත ප්‍රාග්ධනය (ආ) (රු. '000) .. | 39,185 | 32,000 | 36,290 | 38,414 | 40,967 |
| (අ) වැවිලි .. | 34,000 | 25,000 | 29,262 | 31,386 | 33,827 |
| (ආ) කර්මාන්තශාලා .. | 5,185 | 7,000 | 7,028 | 7,028 | 7,140 |
| 2. වැවිලි | | | | | |
| (අ) සංඛ්‍යාව .. | 12 | 15 | 15 | 13 | 13 |
| (ආ) අක්කර .. | 8,654 | 14,734 | 14,250 | 13,015 | 12,827 |
| (ඇ) වගා කළ අක්කර ගණන .. | 5,513 | 6,719 | 9,699 | 9,691 | 9,814 |
| (ඇ) ආදායම (රු. '000) .. | 3,193 | 5,184 | 4,740 | 4,403 | 5,107 |
| (ඉ) ලාභය (+) හෝ පාඩුව (−) (රු. '000) .. | − 350 | + 725 | + 12 | + 30 | + 548 |
| (ඊ) සේවා නියුක්තිය (ගණන) .. | 6,441 | 8,594 | 7,389 | 6,202 | 6,484 |
| 3. කර්මාන්ත ශාලා | | | | | |
| (අ) සංඛ්‍යාව .. | 3 | 4 | 4 | 4 | 4 |
| (ආ) ආදායම (රු. '000) .. | 1,458 | 1,125 | 4,175 | 3,281 | 3,484 |
| (ඇ) ලාභය (+) හෝ පාඩුව (−) (ඇ) (රු. '000) .. | − 134 | − 77 | − 109 | − 145 | − 36 |
| (ඇ) සේවා නියුක්තිය (ගණන) .. | 192 | 356 | 351 | 298 | 226 |
| 4. සංස්ථා එකතුව | | | | | |
| (අ) මුළු ආදායම (රු. '000) .. | 4,651 | 6,309 | 8,951 | 7,484 | 8,591 |
| (ආ) ලාභය (+) හෝ පාඩුව (−) (රු. '000) .. | + 16† | + 295† | + 11† | − 115 | + 512 |
| (ඇ) සේවා නියුක්තිය (සංඛ්‍යාව) .. | 6,633 | 8,950 | 7,740 | 6,500 | 6,713 |

මූලය: රාජ්‍ය වැවිලි සංස්ථාව

(අ) ගිණුම් වර්ෂය ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වේ.
(ආ) ගිණුම් වර්ෂාවසානයට සමුච්චිතය.
(ඇ) බදු අය කිරීමට පෙර
* 1970/71 සංඛ්‍යා තාවකාලිකය.
† සංශෝධිත සංඛ්‍යා ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව පදනම් කරගෙන ඇත.

## (2) ගමනාගමනය, ගබඩා කිරීම සහ පණිවිඩ හුවමාරුව

### (අ) ලංකා දුම්රිය සේවය

1969/70 මුදල් වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 687·5 ක්ව පැවැති මුළු ආයෝජනය 1970/71 අවසානයේදී රුපියල් දශලක්ෂ 689·2 දක්වා දළ වශයෙන් රුපියල් දශලක්ෂ 1.7 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කොට තිබේ.

1969/70 දී ගෙන යන ලද මගීන් සංඛ්‍යාව දශලක්ෂ 85 සිට 1970/71 දී දළ වශයෙන් දශලක්ෂ 83 දක්වා අඩුවී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. කෙසේ වුවද, සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂය තුළදී මගීන් සැතපුම් ගණන ඉකුත් වසරේ වැඩිවීමට වඩා අධිකවී ඇති බැව් පෙනේ. මගීගෙන් ලැබීම් 1969/70 දී දශලක්ෂ 60·3 සිට දශලක්ෂ 44·6 දක්වා අඩුවී ඇත.

මහා මාර්ග ගමනා ගමනය හා තරඟකාරිත්වයක් පැවතියද්ත් ප්‍රවාහන භාණ්ඩ පරිමාවේ ටොන් දශලක්ෂ 0·1 ආන්තික වැඩිවීමක් දක්නට ඇත. භාණ්ඩ ප්‍රවාහණයෙන් ලත් ආදායම රුපියල් දශලක්ෂ 4.6 කින් වැඩිවූ නමුදු භාණ්ඩ සැතපුම් ගණන දශලක්ෂ 22·4 කින් අඩු විය.

දුම්රිය සේවයෙහි ඇස්තමේන්තු කළ මුළු ආදායම රුපියල් දශලක්ෂ 1·8 කින් වැඩිවූ අතර ඇස්තමේන්තු කළ වියදම, රුපියල් දශලක්ෂ 3·0 ක්වී ඇත. වියදමේ අධික වැඩිවීම මගින් ආදායමේ සුළු වැඩිවීම් කැපී ගිය අතර, අලාභය සමස්ථ වශයෙන් 1968/69 දී රුපියල් දශලක්ෂ 57.4 ක මුදුන් මට්ටමට පත්වියයි ඇස්තමේන්තු කර ඇත.

(ආ) ලංකා ගමනාගමන මණ්ඩලය

1970/71 න් අවසන් වන වසර පහ තුළ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ කැපී පෙනෙන ඇතැම් ලක්ෂණ 11 (ඇ) 8 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

මණ්ඩලයේ මුළු ප්‍රාග්ධන ආයෝජනය 1970/71දී රුපියල් දශලක්ෂ 56·1 කින් රුපියල් දශලක්ෂ 376·5 දක්වා වැඩිවූ අතර, මින් රුපියල් දශලක්ෂ 42·4 ක් රථ වාහන සඳහාද, ඉතිරි රුපියල් දශලක්ෂ 13 7 ඩිපෝ කටයුතු ව්‍යාප්ත කිරීම සඳහාද යෙදවුනි.

මණ්ඩලයේ වාහන සංඛ්‍යාව 1970/71 දී 6412 දක්වා රථ 489 කින් වැඩිවී ඇත; ධාවනය වන බස් තොගය 191 කින්ද, ධාවනය සඳහා යෙදවිය හැකි තොගය 166 කින්ද වැඩිවී ඇත.

උපලබ්ධ ගත සැතපුම් ප්‍රමාණය 1970/71 දී සැතපුම් දශලක්ෂ 26·1 කින් වැඩිවූ අතර ධාවන සැතපුම් ගණන සැතපුම් දශලක්ෂ 2·7 කින් වැඩි විය. රථ ආපද හා අවශ්‍ය වෙලාවන්හි බස් සේවක පිරිස් නොමැතිවීම් හේතුකොට ගෙන අපතේ ගිය සැතපුම් ගණන 1969/70 දී සැතපුම් දශලක්ෂ 42· 8 සිට දශලක්ෂ 62. 6 දක්වා වැඩි විය. ගරාජවල සිට බස් පටන් ගන්නා ස්ථාන වලට බස් හිස්ව යෑම නිසා වන හිස් සැතපුම් ගණන සුළු වශයෙන් අඩු විය.

මණ්ඩලයේ සේවක සංඛ්‍යාව දිගින් දිගටම වැඩි වෙමින් පැවති අතර 1970/71 දී එය 47,792 ක් හෙවත්, ඉකුත් වර්ෂයට වඩා 6960 ක් විය. සේවා නියුක්තියේ ඇතිවූ මෙම වැඩිවීම බස්රථ සංඛ්‍යාවේ වැඩිවීම මෙන් 14 ගුණයක වැඩිවීමකි. ධාවනය සඳහා යොදගත හැකි රථ සංඛ්‍යාවෙන් ඒකක් සඳහා 1966/67 දී යොදවා ගත් සේවක සංඛ්‍යාව සාමාන්‍ය වශයෙන් 8·2 ක් වූ අතර 1970/71 දී එම සංඛ්‍යාව 10·2 ක් විය.

1970/71 වර්ෂය සඳහා මණ්ඩලයේ ආදායම රුපියල් දශලක්ෂ 18·2 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 306·2 ක් වූ අතර වියදම රුපියල් දශලක්ෂ 47·3 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 369·4 ක් විය. වියදමේ ඇතිවූ අධික වැඩිවීම කැපියාම හේතුකොට ගෙන 1970/71 දී මණ්ඩලය රුපියල් දශලක්ෂ 63·2 ක අලාභයක් සහිතව ක්‍රියා කරන්නට වූ අතර ඉකුත් වසරේදී එම අලාභය රුපියල් දශලක්ෂ 34·02 ක්ව පැවතිණි. 1971 ජූනි මාසයේදී මණ්ඩලය මගින් සෑම අංශයකම බස් ගාස්තු වැඩි කරන ලදී.

(ඇ) කොළඹ වරාය කොමිෂන් සභාව

1955 වත්කම් අගැයීමේ පදනම අනුව සලකන කල වරාය කොමිෂන් සභාවේ ඇස්තමේන්තු ගත ප්‍රාග්ධන ආයෝජනය 1971 සැප්තැම්බරයේදී රුපියල් දශලක්ෂ 343·8 ක් විය. මෙම වර්ෂයේ සංවර්ධන කටයුතුත් සමග එම සංඛ්‍යාව රුපියල් දශලක්ෂ 380 9 දක්වා වැඩි වෙනු ඇතැයි අපේක්ෂිතය. මෙම ආයොජන වලින් සැලකිය යුතු කොටසක් යොදවා ඇත්තේ කොළඹ වරාය සඳහාය.

1967/68 සිට වැඩි වන උපනතියක් පිළිබිඹු කළ ආදායම 1970/71 දී රුපියල් දශලක්ෂ 50 6 දක්වා වැඩිවිය. ද්‍රව්‍ය මිල වැඩිවීම, ඒකාබද්ධ වැටුප් අනුව සේවකයන්ට වඩා අධික වැටුප් හා අතිකාල දීමනා ගෙවීම, වරාය සේවකයනට සපයන ආහාර වේල් තුනෙහි මිල වැඩිවීම හේතුකොට ගෙන වැඩිවූ නඩත්තු වියදම කරනකොට ගෙන වර්ෂ ගණනාවක් මුළුල්ලේ වැඩිවෙමින් පැවැති කාරක වියදම් 1970/71 දී රුපියල් දශලක්ෂ 30·06 දක්වා වැඩි විය. ආදායමේ ඇතිවූ වැඩිවීම මගින් වියදමේ වැඩිවීම කැපී ගියෙන් 1970/71 දී රුපියල් දශලක්ෂ 3 ක සමස්ථ අතිරික්තයක් වරාය කොමිසමේ වාර්තාගත විය. ඉකුත් වසරේදී එහි ඇතිවූ හිඟය රුපියල් දශලක්ෂ 4·4 ක් බව මෙහිලා සඳහන් කළ හැකිය,

| ලංකාණ්ඩුවේ දුම්රිය[1] | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
|---|---|---|---|---|---|
| 1· ආයෝජිත ප්‍රාග්ධනය[2] (රු. '000) | 614,300 | 639,132 | 665,679 | 687,454 | 689,230 |
| 2· ධාවන පථය (සැතපුම් ගණන) | 1,053 | 1,053 | 1,076 | 1,080 | 1,080 |
| 3· රිය (සංඛ්‍යාව) | 8,067 | 7,353 | 7,484 | 7,400 | 7,390 |
| (අ) දුම්රිය ඇන්ජින් | 355 | 344 | 393 | 328 | 328 |
| (ආ) දුම්රිය මැදිරි | 7,712 | 7,009 | 7,091 | 7,072 | 7,062 |
| 4· ගෙන ගිය | | | | | |
| (අ) මගීන් (දශ ලක්ෂ)[4] | 78·6 | 81·5 | 85·5 | 84·62 | 82.86 |
| (ආ) භාණ්ඩ (ටොන් දශ ලක්ෂ)[5] | 1·8 | 1·8 | 1·8 | 1·70 | 1·78 |
| 5· ධාවන සැතපුම් ගණන | | | | | |
| (අ) මගීන් ගණන (මගීන් දශ ලක්ෂ සැ. ගණන) | 1584·9 | 1678·3 | 1781·2 | 1825·8 | 1884·1 |
| (ආ) භාණ්ඩ ප්‍රවාහන සැ. ගණන (ටොන් සැ. දශලක්ෂ) | 211·9 | 221·5 | 220·0 | 228·3 | 205·9 |
| 6· මුළු ආදායම (රු '000) | 102,100 | 106,769 | 109,681 | 117,042 | 118,831 |
| (අ) මගීන් | 50,600 | 53,944 | 57,038 | 60,293 | 44,637 |
| (ආ) භාණ්ඩ | 43,300 | 44,154 | 43,913 | 46,337 | 50,975 |
| (ඇ) වෙනත් | 8,200 | 8,671 | 8,730 | 10,412 | 23·219 |
| 7 මුළු වියදම[6] (රු. '000) | 148,300 | 168,444 | 140,679 | 144,010 | 147·010 |
| 8· ලාභය ( + ) හෝ පාඩුව[7] ( − ) (රු. '000) | | | | | |
| අ) ක්‍රියාකාරී වීමෙන් | −22,869‡ | −22,900 | −30,998 | −27,022 | −28,178 |
| (ආ) සමස්ථ වශයෙන් | −46,164 | −47,666 | −57,438 | −55,122 | −57,438 |
| 9· සේවා නියුක්තිය | | | | | |
| (අ) සේවකසංඛ්‍යාව[8] | 26,038 | 24,965 | 23,826 | 25,388 | 26,169 |
| (ආ) මුළු වැටුප් බිල[9] (රු. '000) | 82,600 | 87,250 | 98,576 | 105,201 | 108,514 |

| ලංකා ගමනා ගමන මණ්ඩලය[1] | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71 |
|---|---|---|---|---|---|
| 1 ආයෝජන ප්‍රාග්ධනය[2/11] (රු. '000) | 235,015 | 246,110 | 267,369 | 320,392 | 376,494 |
| (අ) වාහන | 188,799 | 195,349 | 211,506 | 251,942 | 294,364 |
| (ආ) වෙනත් | 46,216 | 50,761 | 55,863 | 68,450 | 82,130 |
| 2· වාහන සමූහය (සංඛ්‍යාව) | | | | | |
| (අ) අයත් | 5,056 | 5,457 | 5,881 | 5,923 | 6,412 |
| (ආ) ධාවනය වන බස් සංඛ්‍යාව | 4,363 | 4,721 | 5,110 | 5,625 | 5,816 |
| (ඇ) යෙදවිය හැකි සංඛ්‍යාව | 3,937 | 3,772 | 4,077 | 4,524 | 4,690 |
| (ඈ) අවශ්‍ය වූ සංඛ්‍යාව | 4,167 | 3,939 | 4,085 | 4,724 | 4,957 |
| (ඉ) ක්‍රියාත්මක වූ සාමාන්‍යය | 3,599 | 3,700 | 3,935 | 4,170 | 4,409 |
| 3· සැතපුම් සංඛ්‍යාව (දශ ලක්ෂ) | | | | | |
| (අ) සටහන් කළ | 222·0 | 239·4 | 249·9 | 269·5 | 295·6 |
| (ආ) ක්‍රියාත්මක වූ | 205·9 | 211·2 | 217·4 | 233·8 | 236·5 |
| (ඇ) නැති වූ | 21·3 | 28·2 | 32·5 | 42·8 | 62·6 |
| (ඈ) හිස්ව ධාවනය වූ | 2·3 | 2·3 | 1·9 | 1·5 | 1·2 |
| 4· උපයෝගී කොට ගත් හැකියාව | | | | | |
| (අ) මුළු ආසන සැතපුම් ගණන (සැ. දශ ලක්ෂ) | 10,868·6 | 11,386·8 | 11,643·5 | 12,333·7 | 12,266.1 |
| (ආ) ගෙනගිය මුළු මගීන් ගණන (සැ. දශ ලක්ෂ) | 1,144·8 | 1,250·1 | 1,313·6 | 1,357·7 | 1,337.0 |
| (ඇ) මුළු මගීන් සැතපුම් ගණන (සැ. දශ ලක්ෂ) | 6,183·9 | 6,823·5 | 7,156·5 | 7,394·4 | 7,377.4 |
| (ඈ) පැටවීමේ සාධක (%) | 56·9 | 59·9 | 61·5 | 60·0 | 60.1 |
| (ඉ) උපයෝගී කොටගත් වාහනවලසාමාන්‍යය (දිනකට සැතපුම්) | 157 | 157 | 157 | 154 | 147 |
| 5· ආදායම (රු. 000) | 241,000 | 265,600 | 279,500 | 287,916 | 366,159 |
| (අ) මගීන්ගේ ගමන් ගාස්තු | 236,000 | 259,600 | 273,600 | 280,143 | 297,661 |
| (ආ) වෙනත් | 5,000 | 6,000 | 5,900 | 7,773 | 8,498 |
| 6· වියදම[10] (රු '000) | 237,900 | 272,900 | 292,200 | 322,100 | 369,398 |
| 7 වැටුප් බිල (රු. '000) | 125,000 | 149,700 | 163,300 | 180,300 | 197,102 |
| 8· සේවා නියුක්තිය[3] (ගණන) | 32,165 | 37,547 | 40,097 | 40,832 | 47,792 |
| 9 ලාභය ( + ) හෝ පාඩුව ( − )[7] (රු. 000) | + 1,448 | − 7,195 | −14,046 | − 34,187[13] | −63,239 |

## පණිවුඩ හුවමාරුව

| සීමා සහිත ලංකා ගුවන් සේවය1 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
|---|---|---|---|---|---|
| 1· වත්කම්වල අගය2 (රු. 000) .. .. | 13,303 | 13,698 | 22,149 | 80,304 | 140,304 |
| 2· ගෙනගිය මගීන් සහ භාණ්ඩ | | | | | |
| (අ) මගීන් (සංඛ්‍යාව) .. .. | 82,286 | 80,880 | 78,666 | 98,351 | 119,479 |
| (ආ) භාණ්ඩ (ටොන්) .. .. | 513 | 550 | 523 | 576 | 630 |
| 3· මගීන් සහ බර සැතපුම් | | | | | |
| (අ) මගීන් සැතපුම් '(000) .. .. | 64,547 | 60,577 | 59,619 | 69,545 | 69,710 |
| (ආ) භාණ්ඩ බර සැතපුම් '(000) .. .. | 7,170 | 7,322 | 1,883 | 1,779 | 1,620 |
| 4· ධාරිතා උපයෝගි කරණය (පැටවීමේ සාධක %) | | | | | |
| (අ) අභ්‍යන්තර සේවා .. .. | 38·2 | 56·4 | 67·1 | 59·6 | 53·5 |
| (ආ) ප්‍රාදේශීය සේවා .. . | 50·5 | 50·3 | 43·1 | 31·8 | 33·0 |
| (ඇ) ජාත්‍යන්තර සේවා .. .. | 42·4 | 48·0 | ල· නො· | ල· නො· | ල· නො· |
| 5· මුළු ආදායම (රු. '000) .. .. | 10,348 | 10,593 | 3,274 | 17,546 | 19,097 |
| 6· මුළු වියදම (රු. '000) .. .. | 6,551 | 7,952 | 1,279 | 18,237 | 23,218 |
| 7· ලාභය(+) හෝ පාඩුව (–)7 .. . | + 3,244‡ | + 2,571 | + 1,995† | – 691 | – 4,121 |
| 8· සේවා නියුක්තිය8 (සංඛ්‍යාව) .. .. | 584 | 553 | 609 | 681 | ල· නො· |

| ලංකා නැව් සංස්ථාව1 | | | | 1971 | 1972* |
|---|---|---|---|---|---|
| 1· රජය විසින් දයකවූ ප්‍රාග්ධනය (රුපි· '000) .. | — | — | — | 8,160 | 17,660 |
| 2· විදේශ විනිමය ඉපැයීම් මුළු ආදායම (රුපි. '000) .. | — | — | — | 1,765 | 2,002 |
| 3· මුළු වියදම (රුපි· '000) .. | — | — | — | 1,010 | 1,292 |
| 4· ලාභය + හෝ පාඩුව(—)7 (රුපි· 000) .. | — | — | — | + 755 | + 710 |
| 5· සේවා නියුක්තිය8 (රුපි· 000) .. | — | — | — | 108 | 116 |

| කොළඹ වරාය කොමිසම1 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71 | 1971/72* |
|---|---|---|---|---|---|
| 1· ප්‍රාග්ධන වියදම2 3 (රු. '000) .. | **305,053** | **312,294** | **326,772** | **343,761** | **380,983** |
| (අ) කොළඹ වරාය .. | 273,382 | 280,443 | 289,059 | 303,852 | 337,691 |
| (ආ) ගාල්ල වරාය .. | 25,784 | 29,087 | 31,914 | 33,610 | 34,169 |
| (ඇ) ත්‍රිකුණාමලය වරාය .. | 1,399 | 1,806 | 2,100 | 2,331 | 4,551 |
| (ඈ) අනෙක් වරායන් .. | — | 958 | 3,599 | 3,968 | 4,572 |
| 2· ආදායම (රු. '000) .. | **36,328** | **41,029** | **44,414** | **50,574** | **66,103** |
| (අ) කොළඹ වරාය .. | 35,959 | 40,750 | 44,048 | 50,309 | 65,415 |
| (ආ) වෙනත් වරායන් .. | **369** | **279** | **366** | **265** | **688** |
| (i) ගාල්ල වරාය .. | 30 | 33 | 60 | 72 | 75 |
| (ii) ත්‍රිකුණාමලය වරාය .. | 244 | 217 | 266 | 179 | 562 |
| (iii) වෙනත් වරායන් .. | 95 | 29 | 40 | 14 | 51 |
| 3· කාරක වියදම15 (රු. '000) . | **23,265** | ල· නො· | **30,419** | **30,550** | **41,639** |
| (අ) කොළඹ වරාය . | 22,370 | 26,762 | 30,015 | 29,785 | 40,814 |
| (ආ) වෙනත් වරායන් .. | 215 | ල·නො | 379 | 742 | 800 |
| (ඇ) වෙරළ රක්ෂාවරණය .. | 663 | ල·නො· | 25 | 23 | 25 |
| 4· අතිරික්තිය (+) හෝ හිඟය (—)14 (රු. '000) .. | **+13,743** | **+ 6,590** | **– 4,448** | **+ 3,031** | **– 12,758** |
| (අ) කොළඹ වරාය | +13,589 | ල·නො· | + 5,252 | + 5,728 | – 9,238 |
| (ආ) අනෙක් වරායන් .. | + 154 | ල·නො· | – 9,700 | – 2,697 | – 3,520 |
| 5· සේවා නියුක්තිය8 (සංඛ්‍යාව) .. | ල· නො· | 8,489 | 8,647 | 9,013 | 8,332 |

1 ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා ගිණුම් වර්ෂ සඳහාය. ඇතැම් අවස්ථාවන්හිදී ආසන්නම දහස දක්වා සංඛ්‍යාවන් සකස් කොට ඇත. 2 වර්ෂාවසානයට සමුච්චිතය. 3. රුපියල් දශ ලක්ෂ 177·4 ක් වූ 1955 කොළඹ වරායේ වත්කම්වල අගයීමක් මත පදනම් කොට ඇත. 4. මාසයකට ගමන් 50 ක පදනම යටතේ පිළිඓයල කළ බලපත්‍ර ගමන් බිමන් ඇතුළත්ය. 5. ගාස්තු නොගෙවා කරන භාණ්ඩ පරිවහණය ඇතුළත්ය. 6. ගෙවුම් සහ පොලී ඇතුළත්ය. 7. බදු අයකිරීමට පෙර. 8. වර්ෂාවසානය දක්වාය.

## ගමනාගමනය, ගබඩාකිරීම සහ පණිවුඩ හුවමාරුව

| වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය[1] | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
|---|---|---|---|---|---|
| **1. ආයෝජිත ප්‍රාග්ධනය[2] (රු. '000)** | **52,700** | **64,200** | **51,637** | **53,608** | **54,324** |
| (අ) කොළඹ | 50,100 | 58,100 | 50,137 | 50,137 | 50,137 |
| (ආ) ගාල්ල | 2,600 | 6,100 | 1,500 | 1,500 | 1,500 |
| (ඇ) ත්‍රිකුණාමලය | — | — | — | 1,971 | 2,687 |
| **2. එහා මෙහා කළ භාණ්ඩ (ටොන් '000)** | **3,093** | **3,185** | **3,531** | **3,071** | **2,984** |
| (අ) කොළඹ | 3,040 | 2,906 | 3,223 | 2,757 | 2,729 |
| (ආ) ගාල්ල | 53 | 56 | 47 | 59 | 62 |
| (ඇ) ත්‍රිකුණාමලය | — | 223 | 261 | 255 | 193 |
| **3. ආදායම (රු. '000)** | **75,800** | **86,700** | **115,500** | **123,560** | **119,365** |
| (අ) කොළඹ | 74,700 | 80,200 | 105,662 | 114,484 | 110,110 |
| (ආ) ගාල්ල | 1,100 | 1,100 | 1,406 | 1,158 | 1,655 |
